# Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්ථාව)

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ප්‍රහාරය සම්බන්ධ නඩුවකි. මුස්ලිම් අන්තවාදීන් විසින් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන බවට තොරතුරු දැන සිටියදී ඒ බව පොලිසියට වසන් කිරීම, කුමන්ත්‍රණය ආදී අපරාධමය වැරදි කිහිපයකට චෝදනා ලබා සිටින, පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වූ මරාගෙන මැරෙන බෝම්බකරුවන් වන ඉන්සාෆ් අහමඩ් හා ඉල්හාම් අහමඩ් යන අයගේ පියා සහ සහෝදරයින් දෙදෙනාට එරෙහිව විභාග වන නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/21

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක 5

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 සැප්තැම්බර් මස 22 වන දින

**Author (s) of report (වාර්ථාවේ කර්තෘ හෝ කර්තෘන්):** ඩබ්ලිව්.කේ.එස්.යූ.කේ.වන්නිආරච්චි

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නවරත්න මාරසිංහ මහතා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණී ගිරිහාගම මෙනවිය | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව /ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. මොහොමඩ් යුෂුෆ් මොහොමඩ් ඉබ්‍රාහිම්<br>2. මොහොමඩ් ඉබ්‍රාහිම් ඉජාස් අහමඩ්<br>3. මොහොමඩ් ඉබ්‍රාහිම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 2 වන විත්තිකරු වෙනුවෙන්ජ්‍යෙෂ්ඨ නීතිඥ චමින්ද අතුකෝරල මහතා සහ 3 විත්තිකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ නලින්ද ඉන්දතිස්ස මහතා පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශවය)** | - | |

| | | |
|---|---|---|
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | - | |
| **Others** (වෙනත් අය) | - | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

1. අද දිනයේ පූර්ව නඩු විභාගය සඳහා කැඳවා තිබූ අතර විත්තිකරුවන් තිදෙනාම අධිකරණයේ පෙනී සිටිනු ලැබුහ.

2. නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණී ගිරිහාගම මෙනවිය ප්‍රථමයෙන්ම කරුණු ඉදිරිපත් කරමින් පවසා සිටියේ පැමිණිලි පාර්ශවය විසින් අධිකරණයට ලබා දී තිබූ දිවුරුම් ප්‍රකාශයක දෝෂ සහගත තැන් කිහිපයක් පවතින බැවින් එය නැවත සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙන ලෙසයි.

3. ඒ අනුව විනිසුරුවරයා විසින් නියෝග කරනු ලැබුවේ, අදාළ දිවුරුම් ප්‍රකාශය නිසි පරිදි සකස් කොට, එහි මුල් පිටපත ද ඇතුළුව අධිකරණයට ලබා දීමට ඉක්මනින් පියවර ගන්නා ලෙසයි. නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණී ගිරිහාගම මෙනවිය පවසා සිටියේ අද දිනයේ (22.09.2023) පස්වරු.4.15ට පෙර දිවුරුම් ප්‍රකාශය නැවත නිසි පරිදි සකස් කොට අධිකරණයට ඉදිරිපත් කළ හැකි බවයි. නමුත් විනිසුරුවරයා පවසා සිටියේ එය ප්‍රායෝගිකව අද දිනය තුළ කළ හැකි බව තමන් විශ්වාස නොකරන බවත්, හැකි ඉක්මනින් අදාළ දිවුරුම් ප්‍රකාශය අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙසත් ය.

4. ඉන්පසුව විත්තියේ නීතිඥවරුන්ගෙන් විරෝධතා ඇත්දැයි කළ විමසීමේදී විරෝධතා නැති බව නීතීඥ නලින්ද ඉන්දතිස්ස මහතා විසින් අධිකරණයට දන්වා සිටිනු ලැබීය.

5. ඒ අනුව වැඩිදුර පූර්ව නඩු විභාගය සඳහා ඔක්තෝබර් 04 වන දිනය නැවත නඩුව කැඳවීමට විනිසුරුවරයා නියෝග කරන ලදී.

## 4. Any significant observations inside the court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –

මෙම නඩුවේ ප්‍රධාන විත්තිකරු වූ පාස්කු ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බ කරුවන් දෙදෙනෙකු වූ, ඉන්සාෆ් අහමඩ් සහ ඉල්හාම් අහමඩ් යන අයගේ පියා වන මොහොමඩ් යූෂුෆ් මොහොමඩ් ඉබ්‍රාහිම් අසාධ්‍ය තත්වයක පසුවන බවක් පෙන්නුම් කළේය. ඇවිදීමේ දැඩි අපහසුතාවයක් පෙන්නුම් කළ ඔහු විත්ති කූඩුව කරා රැගෙන යාමේදී හා විත්ති කූඩුවෙන් බැහැරව යාමේදී අනෙක් විත්තිකරුවන් ඔහුව දැඩි පරිශ්‍රමයකින් කැටුව ගිය බව නිරීක්ෂණය විය.

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 ඔක්තෝම්බර් මස 04 වන දින

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**